# මාධ්‍ය නිවේදනය

## ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2022 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2022 වර්ෂය සඳහා නිෂ්පාදන ප්‍රවේශය

## පදනම් වර්ෂය - 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 සිව්වන කාර්තුව (ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31) සහ 2022 වර්ෂය (ජනවාරි 1 සිට දෙසැම්බර් 31) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල සහ ස්ථාවර මිල (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

2021 වර්ෂයේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 13,037,934 ක් ලෙස වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතය 2022 වර්ෂසේ දී රුපියල් මිලියන 12,017,849 ක් ලෙස පහත වැටී ඇත..

2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 7.8 ක සෘණාත්මක වර්ධනයක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම් 2022 වර්ෂයේදී පිළිවෙලින් සියයට 4.6 ක්, සියයට 16.0 ක් සහ සියයට 2.0 ක් වශයෙන් පහත වැටී ඇත.

2022 වසරේ සිව්වන කාර්තුව සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,331,073 සිට රුපියල් මිලියන 2,917,721 දක්වා සියයට 12.4 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කරමින් පහත වැටී ඇත.

**පටුන**

2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබද සාරාංශය - පිටු අංක 2
2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබද පසුබිම - පිටු අංක 3
2022 වර්ෂයේ කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 3
2022 වර්ෂයේ කර්මාන්ත ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 4
2022 වර්ෂයේ සේවා ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 4
2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 5

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## සාරාංශය

2022 වර්ෂය සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2022 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 7.8 ක පසුබෑසීමක් වාර්තා කර ඇති බවයි.

තව ද, 2021 වර්ෂයේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 13,037,934 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 12,017,849 ක් දක්වා පහත වැටී ඇත.

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අතර කාලයේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහනෙහි දැක්වේ.

රූප සටහන 1
මූර්ත දළ දේශීය නිෂ්පාදිතය - 2018 - 2022




මූලය :
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඊට අමතරව, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 17,600,191 ක් ලෙස වාර්තා වූ අතර එය 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 24,147,726 ක් දක්වා සියයට 37.2 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2022 වර්ෂයේ දී පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.7 ක්, සියයට 30.3 ක්, සියයට 56.1 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 4.9 ක් ලෙස වාර්තා වේ.

2022 වර්ෂය තුළ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 4.6 ක්, සියයට 16.0 ක් සහ සියයට 2.0 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## පසුබිම

2021 වර්ෂයේදී කෝවිඩ්-19 වසංගතය සමනය වීමත් සමඟ 2020 වර්ෂයට සාපේක්ෂව නිරීක්ෂණය වූ ආර්ථික ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල වර්ධනය, 2022 වර්ෂයේ ආරම්භයේ සිටම ආපසු හැරවීමට ලක්වූ අතර මෙම කාලය තුළ සිදුවූ නිරන්තර විදුලිය ඇනහිටීම්, සැපයුම් මාර්ගවලට බාධා කළ දිගු ඉන්ධන හිඟය, අමුද්‍රව්‍ය හිඟය සහ දේශීය හා ගෝලීය වෙළඳපොළවල මිල වැඩිවීම්වල ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා ආර්ථිකයේ ප්‍රධාන සංරචක ත්‍රිත්වය වන කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩාල විය.

විශේෂයෙන් පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය ඇතුලු කෘෂිකාර්මික යෙදවුම්වල හිඟය, යෙදවුම්වල මිල ඉහළයාම මෙන්ම ඉන්ධන හිඟය හේතුවෙන්, 2022 වර්ෂය තුළදී කෘෂිකාර්මික අංශය පසුබෑසීමක් වාර්තා කළේය. පසුගිය වර්ෂයට සාපේක්ෂව කර්මාන්ත අංශයේ සිදුවූ සැලකිය යුතු පසුබෑසීම කෙරෙහි ඉදිකිරීම් කර්මාන්තයේ සහ නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල සිදුවූ කඩාවැටීම බලපා ඇත. ඒ සඳහා අමුද්‍රව්‍ය හිඟය, ඉහළ ගිය යෙදවුම් පිරිවැය, ඉන්ධන හිඟය සහ දිගුකාලීන විදුලිය ඇනහිටීම් බලපා ඇත. කෘෂිකාර්මික හා කර්මාන්ත ආර්ථික කටයුතු වල සිදුවූ පසුබෑසීම සමඟ සේවා ආර්ථික කටයුතු ද 2022 වර්ෂයේ දී පසුබෑසීමක් වාර්තා කර ඇත.

2022 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම හා ඊට සමගාමීව සිදුවූ පොළී අනුපාතිකය ඉතා ඉහළ මට්ටමක් දක්වා වැඩිවීම, දේශීය හා ගෝලීය වශයෙන් සැපයුම් අංශයේ සිදුවූ අඩාලවීම් සහ පරිපාලනමය මිල ගණන් සංශෝධනය කිරීම් හේතුවෙන් උද්ධමනය ඉතා ඉහළ මට්ටමක් දක්වා වැඩිවීම සමස්තයක් වශයෙන් 2022 වර්ෂයේ දුර්වල ආර්ථික කාර්යසාධනය කෙරෙහි බලපා ඇත.

## කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්

2021 වර්ෂයේ දී සියයට 0.9 ක ධනාත්මක වර්දනයක් වාර්තා කර තිබු කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2022 වර්ෂයේ දී සමස්තයක් වශයෙන් සියයට 4.6 ක පසුබෑසීමක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික කටයුතුවල වාර්තා වී ඇති මෙම පසුබෑසීම තුළ 'ධාන්‍ය වගා කිරීම' (සියයට 21.6), 'තේ වගා කිරිම' (සියයට 15.9), 'කරදිය ධීවර කටයුතු' (සියයට 15.4), 'වී වගා කිරිම' (සියයට 13.0), 'සත්ව නිෂ්පාදනය' (සියයට 12.9), අනෙකුත් පානීය බෝග වගාව (සියයට 9.1), 'එළවළු වගා කිරීම' (සියයට 8.4), සහ 'රබර් වගා කිරිම' (සියයට 6.7) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් මෙම වර්ෂය තුළ දී වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 16.1), කෘෂිකාර්මික සහාය සේවා කටයුතු (සියයට 14.7), 'මිරිදිය ධිවර කටයුතු (සියයට 11.9.), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 8.6), සහ 'පැළ බෝකිරීම' (සියයට 8.3) ක් වශයෙන් සැලකිය යුතු ලෙස ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්

2021 වර්ෂයේ දී සියයට 5.7 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර තිබු කර්මාන්ත ආර්ථික කටයුතු 2022 වර්ෂයේ දී ද සියයට 16.0 ක සැලකිය යුතු පසුබැසීමක් වාර්තා කර ඇත.

පසුගිය වර්ෂය හා සසඳන විට නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 12.6 ක පසුබැසීමක් වාර්තා කර ඇත. 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 8.1) මෙම වසරේ දී ධන වර්ධනයක් වාර්තා කර ඇති එකම නිමවුම් කර්මාන්ත ක්‍රියාකාරකම වේ. දළ දේශිය නිෂ්පාදිතයට සියයට 7.1 දායකත්වයක් සහිත ප්‍රධානතම නිමැවුම් ආර්ථික කටයුත්ත වන ‘ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය’ සියයට 14.2 කින් පහත වැටී ඇත. එලෙස ම අනෙකුත් සියලුම නිමවුම් කර්මාන්ත කටයුතු ද 2022 වර්ෂයේදී පසුබැසීම් වාර්තා කර ඇත. එහිදි ‘රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 30.7), ), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 29.0), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 26.4), මූලික ලෝහ සහ ව්‍යුවභාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 27.6), 'වෙනත් නිමවුම් කර්මාන්ත' (සියයට 21.7), ‘යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය’ (සියයට 19.0), ‘රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය’ (සියයට 14.0), ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

එමෙන්ම 2022 වර්ෂයේ දී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' සියයට 58.2 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත.

කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් තුළ සියයට 8.0 ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' සියයට 20.9 ක සෘණ වර්ධනයක් 2022 වර්ෂයේ දි වාර්තා කර ඇත. තව ද, 'පතල් හා කැනීම් කර්මාන්තය' ද සියයට 31.0 ක පසුබැසීමක් මෙම වර්ෂය තුළ දි වාර්තා කර ඇත. මේ අතර ‘විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම’ සියයට 5.9 ක සෘණ වර්ධනයක් වාර්තා කරන විට ‘ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම’ සියයට 0.6 ක ධන වර්ධන වේගයක් මෙම වර්ෂය තුළ දි වාර්තා කර ඇත.

## සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්

2022 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 2.0 ක පසුබැසීමක් වාර්තා කර ඇත. 2022 වර්ෂය තුළ 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' සහ 'රක්ෂණ සේවා' පිළිවෙලින් සියයට 11.0 ක් සහ සියයට 47.2 ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත. ඊට අමතරව, පසුගිය වසර හා සැසඳීමේ දී, 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 12.1), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනි විකාශන කාර්යයන්' (සියයට 11.0), 'සෞඛ්‍ය සේවා' (සියයට 8.4), 'වෘත්තීය සේවා' (සියයට 4.0), 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' (සියයට 2.3), සහ 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 0.2) ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත්, සේවා ආර්ථික කටයුතු අතුරෙන් ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ (සියයට 27.0), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 5.7), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 3.5), 'අධ්‍යාපනය' (සියයට 3.8), 'විදුලි සංදේශ සේවා'(සියයට 3.1), 'රාජ්‍ය පරිපාලනය', (සියයට 1.2), සහ 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 0.4) ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ ආර්ථික වර්ධනයන්

2022 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා  සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2021 වර්ෂයේ සිව්වන කාර්තුවේ වාර්තා වූ 1.4 ක ධන වර්ධන වේගය හා සසඳන විට, 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වර්ධන වේගය 12.4 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇති බවයි. 2021 වර්ෂයේ සිව්වන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,331,073 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 2,917,721 ක් දක්වා අඩු වී ඇත. තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 6,575,456 ක් ලෙස වාර්තා වූ අතර එය 2021 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 4,724,501 හා සසඳන විට සියයට 39.2 කින් වැඩිවීමකි. 2022 සිව්වන කාර්තුව තුළ සමස්ත කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් සියයට 30.1 ක සැලකිය යුතු මට්ටමේ පසුබැසීමක් වාර්තා කර ඇති අතර සේවා ක්‍රියාකාරකම් සියයට 3.9 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර සමස්ත කෘෂිකර්මාන්ත කටයුතු සියයට 0.7කින් සුළු ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ හා 2022 වාර්ෂික දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

පී.එම්.පී.අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශිලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+94 11 2147071
+94 11 2877938